දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර

மாவட்ட செயலகம் - அம்பாறை

District Secretariat - Ampara

2019

වාර්ෂික කාර්යය සාධන වාර්තාව හා ගිණුම්

வருடாந்த செயலாற்று அறிக்கையும் கணக்கறிக்கையும்

Annual Performance Reports & Accounts

පෙළ ගැස්ම

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම 1-2

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 3

1.3 ප්‍රධාන කාර්යයන් 4

1.4 සංවිධාන සටහන 5

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල 6

1.6 අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල් 7

1.7 විදේශීය අරමුදල් සපයන ව්‍යාපෘතියේ විස්තර 7

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 8-9

විශේෂ, ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

03. පරිච්ඡේදය - 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 10

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 11

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 12

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන් 13

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 14

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 15

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 16-17

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 18

3.10 විගණකාධිපතිගේ සංක්ෂිප්ත වාර්තා 19-24

04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 25

05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 26-29

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 30

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 30

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේද 30

6.3 මානව සම්පත් සංවර්ධනය 31

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 32-37

<u>**දිසාපතිගේ පණිවුඩය**</u>

2019 වර්ෂයේ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉටුකරනු ලැබූ සේවාවන් හා සිදු කරන ලද ව්‍යාපෘතීන්ට අදාලව වාර්ෂික කාර්යය සාධන වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටින් සහ තෘප්තියෙනි. 2002.09.12 දිනැති අංක 402 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන්හි මූල්‍ය පාලනය පදනම් කරගනිමින් මෙම වාර්තාව පිළියෙල කර ඇත.

වර්ෂ 1961දී පරිපාලන දිස්ත්‍රික්කයක් බවට ස්ථාපනය වූ අම්පාර දිස්ත්‍රික් ඉතිහාසයේ අඩක් පමණම බිහිසුණු යුද්ධයක අඳුරු මතක සහ ලේ පැල්ලම්වලින් පිරී ඇත. එම කාලය තුළදී අඩපණ වූ ප්‍රදේශයේ සංවර්ධන යාන්ත්‍රණය මේ වන විට නව ජවයකින් ඉදිරියට යමින් පවතී. සිංහල, දමිළ, මුස්ලිම් සියලු ජාතිකත්වයන්ට අයත් ජනයා එක්ව ජීවත්වන අම්පාර බහු ආගමික හා බහු සංස්කෘතික ජන සංයුතියකින් යුක්තය. මේ සියලු ජනයාට ආර්ථික හා සමාජයීය ජීවිතය තුළදී විශ්වාසවන්තව සහ එකිනෙකා අගය කරමින්, ජීවත් විය හැකි පරිසරයක් මේ දිස්ත්‍රික්කය තුළ නිර්මාණය කිරීම අප සැමගේ ප්‍රමුඛතම අභිලාෂයක් විය යුත්තේය.

බොහෝ වසරවල මෙරට වැඩිම වී අස්වැන්නකට උරුමකම් කියන, අඛණ්ඩවම වාර්ෂික කව්පි නිෂ්පාදනයේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම දිස්ත්‍රික්කය වන අම්පාර, ජාතික කෘෂි නිෂ්පාදනයේ විශාල පංගුවකට උරුමකම් කියන දිස්ත්‍රික්කයකි. කරදිය මෙන්ම මිරිදිය මත්ස්‍ය කර්මාන්තයද සාර්ථකව සිදුකෙරෙන විවිධ ස්වභාවික සම්පත්වලින් අනූන මෙම දිස්ත්‍රික්කයේ වැසියන් බොහෝ දෙනෙක් කෘෂිකර්මාන්තය ජීවනෝපාය කරගත්තෝ වෙති. එකී සුවහසක් ජනයාගේ ජීවිත සුඛිත මුදිත කොට ඔවුනට වඩා යහපත් අනාගතයක් උරුම කර දීම වෙනුවෙන් රාජ්‍ය ප්‍රතිපත්තීන් කාර්යක්ෂමව ක්‍රියාවට නැංවීමේ අති භාර දූර වගකීම අපගේ උර මත පැටවී ඇත. මෙකී වගකීම ඉටුකිරීමේදී මෙම කාර්යසාධන වාර්තාවේ සඳහන් අරමුණු සපුරාගැනීමට පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය අනුශාසන ලබාදුන් දිස්ත්‍රික්කයේ සර්ව ආගමික නායකත්වයටද, සහයෝගය ලබා දුන් දේශපාලන නායකත්වයටද, රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනයන්හි ප්‍රධානීන්ටද මාගේ කෘතඥතාවය හිමි වේ.

රාජ්‍ය සේවාවන් බිම් මට්ටමට කාන්දු කිරීමේදී අතිශය වැදගත්ම කාර්යභාරය ඉටු කරන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ය. එම කාර්යාල පද්ධතිය අතර සමායෝජනය හා කළමනාකරණය සිදුකරමින් පසුගිය වසරේදී අපගේ ඉලක්කයන් සපුරා ගැනීමට උපරිම දායකත්වය සැපයූ අතිරේක දිස්ත්‍රික් ලේකම්, ප්‍රධාන ගණකාධිකාරී, අධ්‍යක්ෂ (සැලසුම්) හා අනෙකුත් අධ්‍යක්ෂවරු, දිස්ත්‍රික් ඉංජිනේරු, ප්‍රධාන අභ්‍යන්තර විගණක, සහකාර දිස්ත්‍රික් ලේකම්, ගණකාධිකාරී හා පරිපාලන නිලධාරී ඇතුළු සියලුම කාර්යමණ්ඩලයටත්, දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන් ප්‍රධාන එම කාර්යාලවල මාණ්ඩලික නිලධාරීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලවලටත් මාගේ ප්‍රශංසාව පිරිනමමි.

ඩී.එම්.එල්. බණ්ඩාරණායක,
දිසාපති / දිස්ත්‍රික් ලේකම්
අම්පාර දිස්ත්‍රික්කය

1.1 අම්පාර දිස්ත්‍රික්කයේ ඓතිහාසික පසුබිම

පුරාණ ලංකාව රුහුණු, මායා, පිහිටි යනුවෙන් රාජ්‍යයන් තුනක් වශයෙන් පැවතුණි.රුහුණු රාජධානියේ ඉතා වැදගත් දනව්වක් වශයෙන් සැලකූ දීඝවාපී හෙවත් දිගාමඩුලු රාජධානියේ ඉතිහාසය බුද්ධ කාලය දක්වා ඈතට යන බව ඓතිහාසික තොරතුරු වලින් සනාථ වෙයි. වංශ කථාවන්ට අනුව විජය ලංකාවට ගොඩබසින ලද්දේ බුදුරජාණන් වහන්සේගේ පිරිණිවන් පෑම සිදුවූ දිනයේය.මණිඅක්ඛිත නා රජුගේ ඇරයුමෙන් බුදුරජණන් වහන්සේගේ තුන්වන වරට ලක්දිවට වැඩම කරන ලද කල්‍යාණ ගමනේදී දීඝවාපියට වැඩම කරවීම ගැන සඳහන් වේ.

අම්පාර ප්‍රදේශය ආර්ය ජනාවාසයක් බවට පත්වී ඇත්තේ විජය රජුගෙන් පසු පාලකයා බවට පත්වූ පඩුවස් දෙව් රජුගේ අවධියේය. පඩුවස් දෙව් රජුගේ බිසව වන භද්දකච්චායනා කුමරිගේ සහෝදරයකු වූ දීඝායු කුමරු විසින් පිහිටුවන ලද දීඝායුගාම පසුව දීඝවාපී,දිගාවැව හා දිගාමඩුල්ල යන නම් වලින් හැඳින්වුන බව වංශ කථාවන්ට අනුව සඳහන් වී ඇත.

දීඝගාමිණීගේ පුත් පණ්ඩුකාභය කුමරු විසින් අනුරාධපුරය සිය අනසකට ගෙන අනුරාධපුරයෙහි අගනුවර පිහිටවනු ලැබීය.මෙතැන් සිට දිගාමඩුල්ල අනුරපුර මහ රජුගේ එක් ප්‍රාදේශීය පාලන කොට්ටාශයක් වූ අතර, එය ප්‍රධාන ධාන්‍යාගාරය වේ.පොළොන්නරු රාජධානිය බිඳ වැටී පාලන අධිකාරිය නිරිත දිග ප්‍රදේශයට තල්ලු වීමත් සමඟ අම්පාර ප්‍රදේශය වල් බිහිවන්නට විය.

මහසෙන් රජුගේ මහා වාරි කර්මාන්ත ව්‍යාපාරය නැගෙනහිර බින්තැන්නේ සිට තමන්කඩුව හා සේරු නුවර ඔස්සේ නුවර කලාපය තෙක් පැතිරී ඇත. ස්වකීය සංවර්ධන කටයුතු වළදී රුහුණ අමතක නොකළහ. දීර්ඝ කාලයක් තිස්සේ වර්ධනය වූ වාරි කර්මාන්තයට නෂ්ඨාවශිෂ්ට අම්පාර ප්‍රදේශය තුළ සිසාරා ඇවිද යන විට දැකිය හැක. ලංකාවේ ඉතිහාසය ශිලා ලේඛන ගත කිරීමට පෙර ගල්ඔය මිටියාවත වැදි ජනතාවගේ ගොදුරු බිමක්ව පැවති බව ආචර්ය ආර්.එල්. බ්‍රෝහියර් මහතා සඳහන් කර ඇත. මුල් ආර්යන් විසින් පිහිටවූනු ක්‍රි.පූ.03 වන සියවස දක්වා දිවෙන සෙල්ලිපි වල දක්නට ඇත.

අම්පාර දිසාවේ ඉතිහාසය පිළිබඳව කථාකරන කළ රජගල ප්‍රදේශය වටිනා ඓතිහාසික තොරතුරු රැසක් ලැබී ඇති ප්‍රදේශයකි.මෙහි දක්නට ලැබෙන චෛත්‍යයක නටඹුන් අසල පිහිටා ඇති සෙල් ලිපියක "යෙ ඉමදිය පටමය අගනන ඉඨික තෙර මහිද තෙර තුබෙ "යන වාක්‍ය කොටා ඇත.මේ අනුව එම චෛත්‍යය මෙම ද්වීපයේ අභිවෘද්ධිය සඳහා පැමිණි ඉට්ඨිය හා මහින්ද තෙරුන්ගේ දාගැබ ලෙස හඳුන්වා දී ඇත.මෙය මිහිඳු හිමියන්ගේ ලංකා ගමන හා ඒ සමඟ පැමිණි ඉට්ඨිය හිමියන් පිළිබඳ මහා වංශ පුවත සනාථ කරන්නකි. මිහිඳු හිමි පිරිනිවන් පෑ පසු දාතුන් නිදන් කර රටපුරා දාගැබ් ගොඩ නංවා ඇති බවට වන පුවතද සනාථ කරන්නකි.මේ අතරම රජගලින් ලැබී ඇති තවත් ලිපියක දුටුගැමුණු රජුගේ බිසවක් සේ හඳුන්වා ඇති රජිතා නම් කාන්තාව ගැන සඳහන් වේ. මෙය ඓතිහාසික වශයෙන් අතිශය වැදගත් ලිපියකි.

එසේම නන්දිමිත්‍ර යෝධයාගේ හා දුටුගැමුණු රජුගේ පවුල් දෙක අතර විවාහ සබඳතාවක් පිළිබඳ සාධකයක් සපයන සෙල් ලිපියක්ද රජගලින් සොයාගෙන ඇත. මේ සෙල් ලිපිය හා අම්පාර දිස්ත්‍රික්කයේ බමුණුගල සෙල් ලිපියත් එකට සලකා බැලීමේදි දුටුගැමුණු රජුගේ දියණිය නන්දිමිත්‍රගේ පුතෙක් සමග විවාහ වී සිටි බවට සාක්ෂි සැපයේ. දසවැනි සියවසට අයත් කොණ්ඩුවටුවාන සෙල්ලිපිය සුවිශේෂී වැදගත් කමක් ඇති ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස විද්වත්තු පිළිගැනිති. එම සෙල්ලිපියට අනුව අනුරාධපුර යුගයේ අවසාන භාගය වන විටත් අම්පාර සශ්‍රීක සිංහල ජනාවාසයක් වූ බව පැහැදිලිව ඔප්පු කරයි. එකී ගම් ස්වයංපෝෂිත ගම්මාන බව " අලෙවිය සඳහා පිටතින් බඩු නොගෙන්විය යුතු බවට" කර ඇති නියෝගයන් ඇත. එසේම මෙම ප්‍රදේශය අනුරාධපුර රාජධානියට අයත්ව පාලනය වූ බවට තොරතුරු මෙකී සෙල් ලිපියෙන් ප්‍රකාශ වේ.

පොළොන්නරු යුගයේදී අම්පාර වැදගත් තැනක් හිමිකරගත් බවට සාක්ෂි ඉතිහාසයෙන් ලැබේ. සොලී ආධිපත්‍යයෙන් රට මුදාගෙන රට එක්සත් කිරීම සඳහා ගෙන ගිය මහා විජයබාහු (1055-1110) රජුගේ විමුක්ති ව්‍යාපාරයට ද දිගාමඩුල්ල උපකාරී වූ බවට තොරතුරු ඇත.එතුමා දිගාමඩුල්ලේදී කළ සටන් කිහිපයක් ගැන සඳහන් වේ.සුගලා රැජිනගේ ආධිපත්‍යයට දිගාමඩුල්ල අවනතව තිබූ බවට තොරතුරු ලැබිණි.මහා පරාක්‍රමබාහු (1153- 1186) රජතුමා දන්ත දාතුන් වහන්සේ ලබාගැනීම සඳහා සුගලා රැජිණ සමග යුද්ධ කරන ලද්දේ දීඝවාපියේදී බව ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසයේ ග්‍රන්ථයේ සඳහන් වෙයි. මෙයින් පැහැදිලි වන වැදගත් කරුණ වන්නේ ලංකා ඉතිහාසයේ එක් අවධියක දළදා වහන්සේගේ අයිතිය දීඝවාපියට හිමිව තිබූ බවය.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු 1756 වර්ෂයේදී දීඝවාපියට පැමිණ දීඝවාපී දාගැබ ප්‍රතිසංස්කරණය කරවා එම විහාරස්ථානය බන්ඩිගොඩේ නිග්‍රෝධ නායක හිමියන්ට පූජාකළ බවට දීඝවාපී සන්නසේ සඳහන් වේ. මේ පුවත වංශ කථා පුවත් වලින් ද සනාථ වන අතර, දීඝවාපි චෛත්‍යයේ බටහිර වාහල්කඩේ මෑතක් වනතුරු දැකගන්නට තිබූ දුර්වර්ණ වී ගිය චිත්‍ර සටහන් නුවර යුගයට අයත් චිත්‍ර සම්ප්‍රදායට අයත් බව පෙනී ගොස් තිබුණි.

1818 න් පසුව අම්පාර ප්‍රදේශයේ සිදු වූ වැදගත් සිදුවීමක් ලෙස පෙන්වා දිය හැක්කේ වාරි කර්මාන්ත සංවර්ධනයේ ලා බ්‍රිතාන්‍යයන් දැක්වූ දායකත්වයයි. විශේෂයෙන්ම 1853 දී සර් හෙන්රි වෝඩ් ආණ්ඩුකාරවරයා නැගෙනහිර පළාතේ අම්පාර ප්‍රදේශයට පැමිණ මේ ප්‍රදේශයේ වාරි කර්මාන්ත සංවර්ධනය සඳහා මුදල් යෙදවීමේ වැදගත්කම පිළිබඳ අවබෝධ කර ගැනිම වාරිකර්මාන්ත පුනරුත්ථාපනය සඳහා එවක බ්‍රිතාන්‍ය රජයේ මුදල් යෙදවිම ආයෝජනය කිරීමක් සඳහා හේතු විය. මේ යටතේ අම්පාර දිස්ත්‍රික්කයට අයත් දිවුලාන, දඩයන්තලාව, සාගම වැනි ජලාශ පුනරුත්ථාපනය කිරීමත්, 1880 දශකයේදි පට්ටිපොල ආරු ව්‍යාපාරයේ ආරම්භ කිරීමත් සුවිශේෂී සිදුවීමක් විය.පට්ටිපොල ආරු යෝජනා ක්‍රමය යටතේ අම්පාර වැව, කොන්ඩුවටුවාන වැව, එරගම වැව ආදී ජලාශද ගල්ඔය දිගට, අමුණු රැසක්ද ඉදිකර අක්කර 40000 කට ආසන්න ප්‍රමාණයකට වගාවන් සඳහා ජලය ලබාදීමත් සමඟ දිවයිනේ විශාලතම කුඹුරු යාය අම්පාර ප්‍රදේශයෙන් ඉදි කෙරුණි.

ඉන්පසුව 1930 දශකය වන විට ගල්ඔය වාරිමාර්ග යෝජනා ක්‍රමය පිළිබඳ මූලික අදහස වාරිමාර්ග අධ්‍යක්ෂ කෙනඩි විසින් ඉදිරිපත් කිරීමත් සමඟ නැගෙනහිර පළාතේ අම්පාර ප්‍රදේශය නැවත වරක් සංවර්ධනයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්විය. විශේෂයෙන්ම ශ්‍රී ලාංකීය වාරි කර්මාන්ත ඉතිහාසයේ නව පරිච්ඡේදයක් අරඹමින් උස්බිම් ආශ්‍රිත ගැඹුරු ජලාශ ඉදිකර වාරිමාර්ග සඳහා ජලය සැපයීමේ ක්‍රමවේදය යෝජනා කරනු ලැබුවේ ගල්ඔය වාරිමාර්ග සංවර්ධන සැලැස්ම මඟිනි.

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට නව අත්තිවාරමක් පිහිටුවීමට ආධාර වූ කෝල්බෲක් කැමරන් යෝජනා අනුව 1833 දී දිවයින පළාත් පහකට බෙදන ලදී. එහිදී අම්පාර ප්‍රදේශය නැගෙනහිර පළාතට අයත් විය. නැගෙනහිර පළාත ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්කවලින්ද තමන්කඩුව සහ බින්තැන්න ප්‍රදේශ වලින්ද සමන්විත විය. මෙසේ පිහිට වූ පළාත් නැවත දිස්ත්‍රික්කවලට බෙදුණි. ඒ අනුව නැගෙනහිර පළාත ත්‍රිකුණාමලය සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවලින් යුක්ත විය. මඩකලපුව දිස්ත්‍රික්කයට දිගාමඩුල්ල සහ බින්තැන්න ඇතුළත් වේ. 1837 දී බින්තැන්න බදුල්ල දිස්ත්‍රික්කයට යා කරන ලදී. මෙතැන් සිට 1961 දී අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවන තුරු දිගාමඩුල්ල ප්‍රදේශය පාලන බෙදීම්වලට පාත්‍ර නොවුණි.

1.2.අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය දැක්ම, මෙහෙවර ප්‍රකාශය හා අගයන්

දැක්ම

විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරුපිරි දිස්ත්‍රික්කයක්.

මෙහෙවර

දිස්ත්‍රික්කයේ සම්පත් ප්‍රශස්ත ලෙස යහපාලනමය යාන්ත්‍රණය ඔස්සේ කළමනාකරණය කර තිරසර සංවර්ධනය කරා මෙහෙයවමින් නිදහස් හා සුරක්ෂිත හෘදයාංගම පරිසරයක දැනුමෙන්, නිපුණත්වයෙන්, නිර්මාණශීලීත්වයෙන් හා නිරෝගී බවින් සපිරුණු ඉහළ ජීවන තත්ත්වයෙන් හෙබි, ජනතාවක් සහිත ඉසුරුපිරි දිස්ත්‍රික්කයක් හොඩ නැගීම.

අපේ අගයන්

- ❖ හෘදය සංවේදී රාජ්‍ය සේවක කැළක්.
- ❖ සොයා එන හැම දන මන විකසිත වන විශ්වසනීය සේවයක්.
- ❖ නව්‍යත්වය සොයමින් සැනෙකින් විසඳුම් සොයා යන කාර්යය සංස්කෘතියක්.
- ❖ පිවිතුරු හා හරිත පරිසරයක් තුළින් අවියෝජනීයව අවශ්‍යතාවයන් ඉටු කර ගන්නා වූ ප්‍රසන්න පරිශ්‍රයක්.
- ❖ යහපානලමය යොමුවක්

1.3 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආයතන අංශයේ කාර්ය භාරය.

- කාර්යාලයේ පරිපාලනමය කටයුතු
- ආයතන කාර්ය (ආයතන, නිවාඩු, දුම්රිය බලපත්‍ර ආදිය)
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පරිපාලන කටයතු හා අධීක්ෂණ කටයුතු
- ග්‍රාම නිළධාරින්ගේ පරිපාලන කටයුතු
- ආහාර පාලන කටයුතු
- වී මිල දී ගැනීම් කටයුතු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලනමය හා සම්බන්ධීකරණ අංශවල කාර්යය භාර්යය

- කාර්යාලයේ පරිපාලනමය කටයුතු
- සමාජසේවා කටයුතු
- සංස්කෘතික හා ආගමික කටයුතු
- මානව සම්පත් සංවර්ධන හා කුසලතා වර්ධන පුහුණු කටයුතු
- උප්පැන්න, මරණ, විවාහ රෙජිස්ටාර්වරුන් හා හදිසි මරණ පරික්ෂකවරුන් පත් කිරීම පිළිබඳ කටයුතු
- පූරි සභික නාම ලේඛන සකස් කර අධිකරණයට ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික් මට්ටමේ ජාතික උත්සව හා විවිධ වැඩසටහන් සංවිධානය කිරීම.
- මහජන පැමිණිලි සම්බන්ධ කටයුතු
- රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් හරහා සහයෝගය ලබාදීම.
- ආපදා කළමනාකරණ හා සුනාමි නැවත ගොඩනැංවීමේ කටයුතු
- ගිනි අවි හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර කටයුතු
- සංචාරක නිවාස පිළිබඳ පරිපාලන කටයුතු

1.4 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර සංවිධාන ව්‍යුහය



1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනුබද්ධිත ආයතන

අම්පාර නගර මධ්‍යයේ සිට කිලෝමීටර් 01ක් පමණ උතුරට බරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිහිටා ඇත. දිස්ත්‍රික්කයේ පරිපාලනට අදාළ විශාල කාර්යය භාරයක් මෙම කාර්යාලය මගින් ඉටු කරනු ලැබේ. දිස්ත්‍රික් කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල ඉතා සවිමත් බවින් යුතු කලුගල් බැම්මෙන් ඉදිකරන ලද හා පැරණි ගොඩනැගිල්ලක් වන අතර එහි පෞඩත්වය ගල්ඔය ව්‍යාපාරය හා බැදි පවතී. බොහෝ දෙනෙකු මෙය හඳුන්වන්නේ අම්පාර කච්චේරිය යන නමිනි. මෙම කච්චේරි පරිශ්‍රය තුළ විවිධ දෙපාර්තමේන්තු කාර්යාල හා විවිධ අංශවලින් සමන්විතය.

අනු අංකය	දෙපාර්තමේන්තු කාර්යාල හා විවිධ අංශ
01	දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය
02	දිස්ත්‍රික් ක්‍රම සම්පාදන ලේකම් කාර්යාලය
03	සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලය
04	දිස්ත්‍රික් මෝටර් රථ ප්‍රවාහන කාර්යාලය
05	රජයේ විගණන උප කාර්යාලය
06	මිනුම් ඒකක සහ ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුවේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය
07	දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛන කාර්යාලය.
08	ආපදා කළමනාකරණ අංශය
09	දිස්ත්‍රික් ක්‍රීඩා අංශය
10	නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය
11	දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය
12	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය.
13	සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය(පළාත්)
14	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය
15	අතිරේක දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලය.
16	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවා කාර්යාලය
17	සමාජ ආරක්ෂක මණ්ඩලයේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය

1.6 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පාලනය වන ග්‍රාම සේවා වසම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පාලනය වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20ක් ඇත. එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ග්‍රාම සේවා වසම් 503 ක් අයත් වේ. ඒවා පහතින් දක්වා ඇත.

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	ග්‍රාම සේවා වසම් සංඛ්‍යාව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ඇති දුර
1	දෙහිඅත්තකණ්ඩිය	13	160
2	පදියතලාව	20	84
3	මහඔය	17	60
4	උහන	55	12
5	අම්පාර	22	-
6	දමන	33	17
7	ලාහුගල	12	75
8	පොතුවිල්	27	83
9	තිරුක්කෝවිල්	22	40
10	ආලයඩිවෙම්බු	22	26
11	අක්කරපත්තුව	28	26
12	අඩ්ඩාලච්චේන	32	29
13	ඉරක්කාමම්	12	12
14	නින්දවූර්	25	26
15	කාර්තිව්	17	23
16	සායින්දමරුදූ	17	26
17	කල්මුණ (මුස්ලිම්)	29	30
18	කල්මුණ (දෙමළ)	29	30
19	නාවිදන්වෙලි	20	36
20	සම්මන්තුර	51	20

1.7 විදේශීය අරමුදල් සපයන ව්‍යාපෘතියේ විස්තර

හිස් වාර්තාවකි.

02. 2019 වසර සඳහා ඉලක්ක සපුරා ගැනීම්, ඒ සඳහා ඇති වූ අභියෝග හා අනාගත අරමුණු

2019 වර්ෂයේ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉටුකරනු ලැබූ සේවාවන් හා සිදුකරන ලද ව්‍යාපෘතීන්ට අදාළව වාර්ෂික කාර්ය සාධන පහත ඉදිරිපත් කෙරේ.

01. 2019 වර්ෂයේ කාර්ය සාධනය

i. මෙම දිස්ත්‍රික්කයේ වැසියන් බොහෝ දෙනෙක් කෘෂිකර්මාන්තය ජීවනෝපාය කරගන්නෝ වෙති. 2019 වසරේදී ඩී.එස්.සේනානායක සමුද්‍රයේ අඩු ජල ධාරිතාවක් යටතේ ගොවීන් මුහුණ දුන් ගැටළුවට මනා ජල කළමනාකාරීත්වයක් යටතේ කටයුතු කර 80% ක් පමණ ගොවිජනතාවට වගා පහසුකම් ලබා දීමට හැකිවිය. ජාතික වී අස්වැන්නේ 1/5 ක පමණ පංගුකරුවෙකු වීමට මෙම දිස්ත්‍රික්කයට හැකිවිය.

ii. සිංහල, දමිළ, මුස්ලිම් ජාතිකත්වයන්ට අයත් විවිධ ජනයා එක්ව ජීවත්වන අම්පාර බහු ආගමික හා බහු සංස්කෘතික ජන සංයුතියකින් යුක්තය. මේ ජන කොටස් එක්කරගමින් මෙම වර්ෂයේ ජාතික දින නිදහස් උත්සවය මෙම දිස්ත්‍රික්කයේ උත්කර්ෂවත් අන්දමින් සාර්ථකව පැවැත්වීමට හැකිවිය.

iii. ජාතික ව්‍යවසනයක් බවට පත් වූ 2019 වසරේ අප්‍රේල් මස සිදු වූ කිතුනු පල්ලි හා ප්‍රසිද්ධ ස්ථානවල සිදු වූ බෝම්බ පිපිරීම, බහු ජාතික බහු ආගමික ජනතාවන් වෙසෙන මෙම දිස්ත්‍රික්කයේ සාමය, සංහිඳියාව මනාව පවත්වාගෙන යමින් සුළු සිද්ධියක් හෝ ඇති නොවීමට කටයුතු කරමින් ව්‍යසනකාරී තත්ත්වයට සාර්ථකව මුහුණදීමට හැකිවිය.

iv. මහජනතාවගේ දායකත්වය ලබා ගනිමින් ගම්මාන සියල්ල ආවරණය වන පරිදි විවිධ ව්‍යාපෘති සිදු කරමින් "රට වෙනුවෙන් එකට සිටිමු" ජාතික වැඩසටහන උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවත්වමින් සාර්ථක අන්දමින් නිම කිරීමට හැකි විය.

v. අම්පාර දිස්ත්‍රික්කයේ හේන් ගොවිතැන යටතේ වූ බඩඉරිඟු වගාවට ඇති වූ සේනා දළඹු උවදුර ජාතික මට්ටමට නොගොස් සාර්ථක අන්දමින් මැඩ පවත්වා ගැනීමට හැකිවීම හා ගොවීන්ට සිදුවූ අලාභ වෙනුවෙන් වන්දි ගෙවීමට කටයුතු කිරීමට හැකි විය.

vi. රුක් රෝපණ කටයුතු ආදී පරිසර සංරක්ෂණ කටයුතුවලට සාර්ථක අන්දමින් දායකවීමට හැකි විය.

vii. ජාතික හා ජාත්‍යන්තර සර්ෆින් තරඟ අම්පාර දිස්ත්‍රික්කයේ ආරුගම්බේ වෙරළ තීරයේදී රාජ්‍ය මැදිහත්වීම යටතේ සාර්ථකව පැවැත්වීමට 2019 වර්ෂයේ අග භාගයේදී හැකිවිය.

viii. බහු ජාතික, බහු ආගමික පරිසරයක් තුළ බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි සියළු ආගමික පුනරුදයක් වෙනුවෙන් සෘජුව මැදහත් වෙමින් කටයුතු කිරීමට හැකි විය.

ix. 2019 වර්ෂයේ පැවති ජනාධිපතිවරණයේදී මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා අවම කර ගනිමින් සාර්ථකව ඡන්දය පැවැත්වීමට කටයුතු කිරීමට හැකිවිය.

x. වී මිලදී ගැනීම් කාර්යයේදී දිවයිනේ අනෙකුත් දිස්ත්‍රික්ක අභිබවා මෙට්‍රික් ටොන් 12,000 කට ආසන්න ප්‍රමාණයක් වී මිලදී ගැනීම් සිදුකර වැඩි වෙමින් තිබූ සහල් මිල තුලනය කිරීමට දායක වීමට මෙම දිස්ත්‍රික්කයට හැකි විය.

xi. වර්ෂ අවසානයේ නැගෙනහිර පළාතට බලපාන ඊසාන දිග මෝසම් වර්ෂාවේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ආපදා තත්ත්වයට සාර්ථකව මුහුණදීමට හැකි වූ අතර විපතට පත් වූවන්ට සහන සැලසීමේ කටයුතු සාර්ථක ලෙස සිදු කිරීමට හැකිවිය.

xii. දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් වෙන් වූ ප්‍රතිපාදන උපරිම අයුරින් උපයෝජනය කර ගනිමින් සාර්ථක ලෙස දිස්ත්‍රික්කයේ සංවර්ධනය වෙනුවෙන් දායක වීමට හැකි විය.

xiii. ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලියෙන් "විශිෂ්ඨ කුසලතා සම්මානයක්" ලබා ගැනීම.

02. කාර්ය සාධනය ඉටු කිරීමේදී ඇති වූ අභියෝග

i. ගොවීන්ට වගා පහසුකම් සලසා දීමේදී අඩු ජල ධාරිතාවයක් යටතේ විශාල කළමනාකාරීත්වයකින් යුතුව කටයුතු කිරීමට සිදුවීම.

ii. බඩඉරිඟු වගාවට ඇති වූ සේනා දළඹු උවදුර

iii. අප්‍රේල් මාසයේදී දිවයිනේ ඇති වූ ව්‍යසනකාරී තත්ත්වයේදී බහු ජාතික, බහු ආගමික ජනතාව වෙසෙන දිස්ත්‍රික්කයක් වූ අම්පාර දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආකල්ප තුලනය කර ගනිමින් ප්‍රදේශයේ සාමය සංහිඳියාව පවත්වාගෙන යාමට සිදු වීම.

iv. දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අඩු පහසුකම්, අඩු කාර්ය මණ්ඩලයක් යටතේ කටයුතු කරගෙන යාමට සිදුවීම.

03. අනාගත අරමුණු

i. ස්වයංපෝෂිත දේශයක් කරා යන ගමනේදී 23% ක් පමණ වන දිස්ත්‍රික් සහල් නිෂ්පාදනය 25% දක්වා ඉහළ නංවා තැබීමට කටයුතු කිරීම.

ii. අතුරු නිෂ්පාදන වන කව්පි, මුං, කිරි නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමට කටයුතු කිරීම.

iii. අලි වැට ඉදිකිරීමේ ප්‍රතිඵලයක් ලෙස අලි මිනිස් ගැටුම අවම කිරීමට කටයුතු කිරීම.

iv. අමුද්‍රව්‍ය, නිමි ද්‍රව්‍ය බවට පත් කර කාන්තා මූලික පවුල්වල කාන්තා ව්‍යවසායකයින් බිහි කිරීමට අවශ්‍ය කටයුතු සැලසීම.

v. රුක් රෝපණ කාර්යයන් වැඩිදියුණු කරමින් වන වැස්ම 3%කින් ඉහළ නැංවීමට කටයුතු කිරීම.

vi. ප්‍රදේශයේ පවතින වියළි කාලගුණික තත්ත්වය අනුව සූර්යාලෝකය ආධාරයෙන් විදුලිබල උත්පාදන කාර්යයට දායක වීම.

vii. දැනටමත් ජාතික තලයේ ඉහළ මට්ටමකින් පවත්වාගෙන යනු ලබන මිරිදිය කර්මාන්තයේ නියුක්ත වූවන් ප්‍රමාණය ඉහළ නංවා මිරිදිය මසුන් වගාකර දිවයිනේ ප්‍රථම ස්ථානයට පැමිණීම

viii. ආකර්ෂණීය ස්ථාන වැඩිදියුණු කර සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම තුළින් අම්පාර දිස්ත්‍රික්කයේ මේ ආශ්‍රිත රැකියාවල නිරත ආයෝජකයින්ගේ ආදායම් ඉහළ දැමීම.

ix. දැනටමත් සැලසුම් කර ඇති නගර සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර විධිමත්, අලංකාර ක්‍රමවත් නගර දිස්ත්‍රික්කය තුළ ස්ථාපනය කිරීම.

x. දිස්ත්‍රික්කයේ ප්‍රධාන කෘෂි අමුද්‍රව්‍ය වන සහල්, බඩඉරිඟු, එළකිරි, මත්ස්‍ය වගාවන් යොදාගෙන අගය වැඩි කළ නිෂ්පාදන කර්මාන්ත සඳහා ආයෝජකයින් ගෙන්වා ගෙන දිස්ත්‍රික්කයේ නිෂ්පාදන ඉහළ නැංවීම.

ඩී.එම්.එල්.බණ්ඩාරනායක,
දිසාපති / දිස්ත්‍රික් ලේකම්,
අම්පාර දිස්ත්‍රික්කය.

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අයවැය 2019		සටහන	2019	2018	
			සත්‍ය	රු.	
-	**ආදායම් ලැබීම**				
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ - 1
-	ජාත්‍යන්තර වෙළදාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		5,472,263,988	3,476,980,423	ඒසීඒ - 3
-	තැන්පතු		1,010,042,555	815,279,772	ඒසීඒ - 4
46,000,000.00	අත්තිකාරම් ගිණුම්		57,686,391	53,942,344	ඒසීඒ - 5
-	වෙනත් ලැබීම්		387,032,340	195,429,019	
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**6,927,025,274**	**4,541,631,558**	
-	**මුළු ආදයම් නොවන ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)**		**6,927,025,274**	**4,541,631,558**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්ථන වියදම්**				
780,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	765,520,841	731,926,197	
139,700,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	133,177,629	110,597,618	
5,300,000	සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම්	7	4,037,717	4,061,666	ඒසීඒ-2(ii)
-	පොලී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්ථන වියදම්	9	-	-	
925,000,000	**මුළු පුනරාවර්ථන වියදම් (ඈ)**		**902,736,187**	**846,585,482**	
	මූලධන වියදම්				
19,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10	13,546,990	18,644,095	
108,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	36,371,774	54,674,746	
-	ප්‍රාග්ධන මාරු කිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
2,500,000	හැකියා වර්ධනය	14	1,300,264	1,999,372	
4,050,000	වෙනත් මූලධන වියදම්	15	2,675,592	-	
134,050,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**53,894,620**	**75,318,213**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**964,939,853**	**881,260,983**	
-	**තැන්පතු ගෙවීම්**		891,585,582	803,269,074	ඒසීඒ - 4
75,000,000.00	**අත්තිකාරම් ගෙවීම්**		73,354,271	77,991,909	ඒසීඒ - 5
	මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)		**1,921,570,659**	**1,803,164,678**	
-	**2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ=(ඈ+ඉ+ඊ)**		**5,005,454,615**	**2,738,466,880**	

3.3. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර 31.12.2019 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර
31.12.2019 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2019 රු.	2018 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ- 6	1,377,458,356	704,267,838
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ- 5/5(ඒ)	211,475,953	195,827,573
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ- 3	-	-
මුළු වත්කම්		1,588,934,309	900,095,411
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		(150,657,709)	(43,748,996)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,377,458,356	704,267,838
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ- 4	358,033,542	239,576,569
අග්‍රිම ශේෂය	ඒසීඒ- 3	4,100,120	-
මුළු වගකීම		1,588,934,309	900,095,411

පිටු අංක 01 සිට 22 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 23 සිට 30 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ.මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදු කර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත.ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා ඊට අදාල ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී	ප්‍රධාන ගණකාධිකාරී
එස්. හෙට්ටිආරච්චි	නම : ඩී.එම්.එල්.බණ්ඩාරනායක	එම්.අයි.එම්.මුස්තෆා
ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	දිස්ත්‍රික් ලේකම්	දිනය : 2020.02. 24
දිනය : 2020.02. 28	දිනය : 2020.02. 24	

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
"නිල මැදුර"
ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

D.M.L. Bandaranayake
Government Agent
District Secretary
Ampara District

M.I.M. Musthafa
Chief Accountant
District Secretariat
Ampara

3.4 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

සත්‍ය රු.

	2019	2018
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	387,032,340	195,429,019
අග්‍රිම ලැබීම්	5,472,263,988	3,476,980,423
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ආ)	**5,859,296,328**	**3,672,409,442**
අඩු කළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	897,315,780	842,523,815
සහනාධාර සහ මාරු කිරීම්	4,037,717	4,061,666
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද වියදම්	1,968,135,350	1,307,233,508
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**2,869,488,846**	**2,153,818,990**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**2,989,807,482**	**1,518,590,452**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොලී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපකරණ අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	73,093,054	64,047,931
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**73,093,054**	**64,047,931**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	3,078,979,070	1,489,513,510
අත්තිකාරම් ගෙවීම්	98,220,219	105,135,670
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඉ)	**3,177,199,289**	**1,594,649,180**
	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(3,104,106,235)**	**(1,530,601,249)**
	-	-
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)	**(114,298,753)**	**(12,010,797)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	1,010,047,714	815,279,772
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**1,010,047,714**	**815,279,772**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	891,648,741	803,269,074
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**891,648,741**	**803,269,074**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**118,398,973**	**12,010,697**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)=(උ)-(ඒ)	4,100,220	(100)
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	(100)	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**4,100,120**	**(100)**

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

1. <u>**වාර්තාකරණ කාල පරිච්ඡේදය**</u>

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. <u>**මිනුම්කරණ පදනම**</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. <u>**ආදායම් හඳුනාගැනීම.**</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. <u>**දේපළ පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම.**</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

5. <u>**දේපළ පිරියත හා උපකරණ**</u>

මෙම සංචිත ගිණුම දේපළ පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. <u>**මුදල් හා මුදල් සමාන දෑ**</u>

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව			
		මුදල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
1003-07-02	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ආදායම්	25,000,000.00	-	**24,745,554.10**	98.98
1003-07-03	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආදායම	2,000,000.00	-	**1,709,428.00**	85.47
1003-07-05	ආරක්ෂක හා නාගරික අමාත්‍යාංශය	250,000.00	-	**248,030.00**	99.21
1003-07-09	කාබන් ආදායම	55,000,000.00	-	**54,063,899.93**	98.29
1003-07-99	ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	8,500,000.00	-	**8,471,054.37**	99.65
2002-01-01	රජයේ ගොඩනැගිලි සහ නිවාස කුලියට දීම	3,200,000.00	-	**3,174,106.23**	99.19
2002-01-03	ඉඩම් ආදායම	25,900,000.00	-	**25,862,673.81**	99.85
2002-02-99	වෙනත් ආදායම්	10,000,000.00	-	**10,108,673.59**	101.08
2003-02-13	විභාග සහ වෙනත් ගාස්තු	900,000.00	-	**852,310.00**	94.70
2003-02-14	මෝටර් රථවාහන පනත සහ වෙනත් කුවිතාන්සි යටතේ ගාස්තු	98,000,000.00	-	**97,109,688.50**	99.09
2003-02-03	පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු	12,100,000.00	-	**12,092.,336.00**	99.93
2003-02-99	විවිධ වියදම්	1,000,000.00	-	**905,009.00**	90.50
2003-03-02	දඩ සහ වංචා - වෙනත්	1000.00	-	**1000.00**	100
2003-99-00	වෙනත් කුවිතාන්සි	94,000,000.00	-	**93,292,462.93**	99.24
2004-01-00	මධ්‍යම රජය	55,000,000.00		**54,271,013.40**	98.67
2006-02-00	ප්‍රාග්ධන වත්කම් විකිණීම	125,100.00	-	**125,100.00**	100

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ඒසීඒ - 2

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය :270 **අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අම්පාර**

වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය	වියදමෙහි නම	අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම (1)	පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම (2)	මු.රෙ. 66/69 මාරු කිරීම (3)	මුළු ශුද්ධ වෙන් කිරීම 4=(1)+(2)+3)	මුළු වියදම (5)	ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/(ඉක්මවීම්) 6= (4)-(5)
		රු.	රු.	රු.	රු.	රු.	රු.
වැඩසටහන (1)							
(a) පුනරාවර්තව (ඒසීඒ-3)	(1) පුනරාවර්තන	925,000,000	-	15,500,000 (15,500,000)	925,000,000	902,736,187	22,263,813
(b) ප්‍රාග්ධන (ඒසීඒ-4)	(2) ප්‍රාග්ධන	130,000,000	4,050,000	-	134,050,000	53,894,620	80,155,380
මුළු එකතුව		**1,055,000,000**	**4,050,000**	-	**1,059,050,000**	**956,630,806**	**102,419,194**

3.8. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුදල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීමේ පුනරුත්ථාපනය, උතුරු පළාත් සංවර්ධනය, වෘත්තීය පුහුණුව සහ නිපුණතා සංවර්ධනය සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය.	DCB ව්‍යාපෘතිය (104-2-6-1-2506)	93,380,000.00	93,380,000.00	87,680,798.85	93.89
02		RIDP ව්‍යාපෘතිය (104-2-6-6-2506)	436,116,142.00	436,116,142.00	119,066,396.55	27.30
03		ආගමික ව්‍යාපෘතිය (104-2-6-7-2509)	10,500,686.00	10,500,686.00	9,773,896.70	93.07
04		ගම්පෙරළිය ව්‍යාපෘතිය (104-2-6-20-2506)	1,723,600,000.00	1,723,600,000.00	1,681,540,011.31	97.54
05		නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය (104-2-14-30-2202)	120,469,665.00	120,469,665.00	108,683,621.00	90.03
06		නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය (104-2-14-41-2205)	23,254,250.00	23,254,250.00	19,115,370.00	82.20
07		නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය (104-2-14-44-2509)	150,000,000.00	150,000,000.00	141,585,461.41	94.38
08	කර්මාන්ත හා සන්නිවේදන දිගුකාලීන අවතැන්වූවන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධනය සහ වෘත්තීය පුහුණුව සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය	යටිතල පහසුකම් සංවර්ධන කටයුතු (149-2-3-12-2202)	110,229,480.00	110,229,480.00	20,755,967.75	18.82
09	ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය	ONUR (157-1-2-5-2202)	121,071,153.00	121,071,153.00	43,760,796.00	36.14
10		ප්‍රතිසන්ධාන සංවර්ධනය (157-1-2-13-2509)	112,120,641.00	112,120,641.00	96,614,184.00	86.16
11		ප්‍රතිසන්ධාන සංවර්ධනය (157-1-2-19-2509)	15,580,000.00	15,580,000.00	7,622,058.00	48.92

12	රාජ්‍ය ව්‍යවසාය, මහනුවර උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යාංශය	නුවර උරුම (158-1-2-2-2202)	15,540,000.00	15,540,000.00	8,056,615.00	51.84
13	සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය	සංචාරක (159-1-2-2-2202)	3,289,011.00	3,289,011.00	2,297,510.00	69.85
14	මෙගා පොලිස් හා බටහිර සංවර්ධන අමාත්‍යාංශය	සුබිත පුරවර (162-2-3-23-2506)	32,820,131.00	32,820,131.00	24,413,738.00	74.38
15	නගර සැලසුම් අමාත්‍යාංශය	ජලාපවහන (166-2-3-39-2506)	6,253,766.00	6,253,766.00	6,253,764.00	99.99
16		සනීපාරක්ෂාව (166-2-3-9-2506)	3,725,000.00	3,725,000.00	3,070,000.00	82.41
17	විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය	ක්‍රීඩා සංවර්ධනය (194-2-4-1-2506)	19,007,989.00	19,007,989.00	13,551,817.00	71.29
18	සමෘද්ධි සංවර්ධන	යටිතල පහසුකම් සංවර්ධනය (331-2-2-3-2509)	163,508,715.00	163,508,715.00	117,691,586.00	71.97
19	ජනාධිපති ලේකම් කාර්යාලය	"ග්‍රාම ශක්ති " ව්‍යාපෘති ගොඩනැගීමේ මාර්ගය (001-2-6-11-2202)	80,540,000.00	80,540,000.00	51,711,502.49	64.20
20	බුද්ධසාසන අමාත්‍යාංශය සහ වයඹ සංවර්ධන	ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ කටයුතු දහම් පාසල	27,009,871.87	27,009,871.87	25,888,182.38	95.84

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි සහ ව්‍යුහයන්	581,014,231.22	581,014,231.22	-	0%
9152	යන්ත්‍රෝපකරණ	618,351,354.59	618,351,354.59	-	0%
9153	ඉඩම්	174,929,000.00	174,929,000.00	-	0%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	0%
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	0%
9160	වැඩ කිරීමේ ප්‍රගතිය	3,163,769.70	3,163,769.70	-	0%
